කාන්තාව, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගනිමින් කොන් නොකරන, ඒකාකෘතික නොකරන මාධ්‍ය භාවිතාවකට යොමු වෙමු. ඒ වෙනුවෙන්, කාන්තාවන් සම්බන්ධයේදී පුවත් වාර්තා කිරීමේදී පිළිපැදීමට යෝග්‍ය මාධ්‍ය මාර්ගෝපදේශයන් කිහිපයක් අපි මෙසේ ඉදිරිපත් කරමු.

මූලාශ්‍ර:

https://africa.unwomen.org/.../Gender%20and%20Media...
https://www.freepressunlimited.org/.../Gender%20Equality...
https://eca.unwomen.org/.../Guidelines_ENG_prew_40719...
https://whomakesthenews.org/.../mediaadvocacytoolkit_wacc...
https://www.apa.org/.../journals/features/vio-vio0000198.pdf



1) කාන්තාවන්ගේ භූමිකාව ගෙදරදොර වැඩවලට පමණක් සීමාවූවක් වැනි ඒකාතික කිරීම්වලින් වලකින්න.

2) කාන්තාවන් කොන් කරන, පීඩාවට ලක් කරන වචන, යෙදුම්, සහ අදහස් දැක්වීම් භාවිතා නොකරන්න. එක් ලිංගික අනන්‍යතාවයකට පමණක් නැඹුරු වූ, අගතිගාමී යෙදුම් භාවිතා නොකරන්න.

[උදා: "සුන්දරියෝ" වැනි කාන්තා බාහිර රූපයෙන් නිර්වචනය කරනා යෙදුම් භාවිතා නොකරන්න].

3) කාන්තාවන් පිළිබඳව පූර්ව උපකල්පනයන් සිදු නොකරන්න.

[උදා: "ඔබ කාන්තාවක් ලෙස මෙවැනි සාර්ථක ව්‍යාපාරයක් මෙහෙයවන්නේ කෙසේද?" වැනි, කාන්තාවන්ට එවැනි දෑ සිදු කළ නොහැකිය යන උපකල්පනය මත පිහිටා ඇසන ප්‍රශ්න වලින් වළකින්න].

4) කාන්තාවන් ලිංගික වස්තූන් ලෙසින් දැක්වීමෙන් වළකින්න. එය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට ද හේතු විය හැක.

